# පෙරවදන

ගෙවත්තේ වැවී ඇතත්, මඟ තොටේදී නිතර දකින්නට ලැබෙතත්, ගස්වැල්වල ඇති විවිධත්වය සහ විශේෂත්වය පිළිබඳ අවධානය යොමුකරන්නේ අප අතරින් කිහිප දෙනෙක් පමණි. ශාක සම්පත ගැන අපගේ මවුබසින් ලියැවුණු පත පොතින්ද බොහෝවිට විස්තර වන්නේ ශාකවල ප්‍රයෝජන, ව්‍යාප්තිය මෙන්ම ඒවායේ මල් හා ඵල හටගැනීම, පත්‍ර හැලීම යන ජීවන තොරතුරුය.

අසිරිමත් ශාක ලෝකයේ දැකිය හැකි සුවිශේෂී ශාක පිළිබඳව විද්‍යාත්මක තොරතුරු බොහෝවිට අපට හමුවන්නේ ඉංග්‍රීසි භාෂාවෙන් ලියවුණු පතපොතිනි. ස්වභාව ධර්මයේ ආශ්චර්යයන් ලෙසට ශාක කිහිපයකට සීමා වූ එවන් විදු තතු බිඳක් නව ආරකට, ඉතා සරල බසින් දරු දැරියන් වෙත ඉදිරිපත් කිරීම මේ ග්‍රන්ථයේ අරමුණයි. සුවිශේෂී උද්භිද විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳව අපේ දරුවන් දැනුවත් කිරීමට ශාක විශේෂ කිහිපයක් තෝරාගනිමින්, ඒ ගැන පහසුවෙන් මතක තබාගත හැකිවන පරිදි ශාක හඳුන්වා දීමට මා බලාපොරොත්තු වන්නේ ගහක් උඩ ගහක්, කොළ නැති ගස්, උසට හැදෙන මීවන, කෘමින් ගිලින පැළෑටි, මකුළු දැලක්ද? පැළෑටියක්ද? යනා දී වශයෙනි. අන්තර්ගත රසායනික ද්‍රව්‍ය නිසා සමහරක් ශාක සුවිශේෂී වන්නේ කෙසේදැයි විද්‍යාත්මක ලෙස විස්තර කිරීමට මා උපයෝගී කරගන්නේ දැනට ව්‍යවහාරයේ පවතින ශාක නාම කිහිපයකි. නිදසුන් ලෙසට මදුරුවන් පලවා හරින මදුරුතලා, වත්ත පාළු කරන වතුපාළු, පොඩි සිඤ්ඤෝ මරං, ගෑවුනත් කසන කහඹිලියා යනාදිය දැක්විය හැකිය. මේවා තුළ අඩංගු රසායනික සංයෝග සහ ඒවා පරිසරයට මුදාහරින ක්‍රමවේදයන් පැහැදිලි කිරීමටද මෙම ග්‍රන්ථය උත්සහ දරයි. විශේෂ විකරණ සහ කායකර්මීය යාන්ත්‍රණ නිසා ද සමහර ශාක වර්ග අනිත්වා අතරින් කැපී පෙනෙයි. කඩොලාන පරිසරයේ දැකිය හැකි ජලාබුජතාවය, සමහර රනිල ශාකවල දැකිය හැකි නිද්‍රාජනක චලන මින් කිහිපයකි. මේවා ගැන මේ ග්‍රන්ථයෙන් විස්තර ඉදිරිපත් කරනුයේ ඒවා පිළිවෙලින් ''මව් ඇකයේදීම වැඩෙන දරුවන්''හා ''නින්දට යන ගස්'' ලෙසටය. මීට අමතරව ශාක මුල්, කඳ, පත්‍ර හා ඵලවල දැකිය හැකි විකරණ කිහිපයක් විස්තර කර දීමට ''අරුම පුදුම ගස්වැල්'' කෘතිය බලාපොරොත්තු වෙයි. කඳුකර පරිසරයේ ශීත දේශගුණයට ඔරොත්තු දීම සඳහා හොඳින් සැකසුණු, මාස අටක පමණ දිගු අයුකාලයක් ඇති පත්‍ර නිසා එම ගසට ''පොල්කටු ගස'' යන නම ලැබුණු බවත්, පරපෝෂී ''අග මුල නැති වැල්'' පිළිබඳවත් මෙහිදී විස්තර අඩංගු වෙයි. කිරල සහ මණ්ඩා ශාකවලට විශේෂිත සෘණ ගුරුත්වාවර්ති මුල් ගැන ''මඩේ ඉනි සිටුවන්නේ කව්ද?'' යනුවෙන්ද, නුග වර්ග වලට සුවිශේෂී ප්‍රාග් උදුම්බරය නම් පුෂ්ප මංජරිය ගැන ''ගෙඩියද? මලද? සැකහැරගන්න'' යනුවෙන්ද සරල බසින් විද්‍යාත්මක තොරතුරු ඔබ වෙත ගෙන ඒමට මම උත්සාහ ගනිමි.

ගස්වැල් අතර දැකිය හැකි අරුම පුදුම තොරතුරු මෙසේ ඔබ වෙත ගෙනඒමට මා දිරිගැන්වූ කිහිපදෙනෙක් ගැන මෙහිදී සඳහන් කිරීම මාගේ යුතුකමකි. ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා පදනමේ විද්‍යාව ප්‍රචලිත කිරීමේ කමිටුවත්, විද්‍යා ග්‍රන්ථ ප්‍රකාශන වැඩසටහනත් නොතිබුණා නම් මේ ග්‍රන්ථය ඔබ අතට පත්නොවීමට ඉඩ තිබිණි. එබැවින් මම ජාතික විද්‍යා පදනමට බෙහෙවින් කෘතඥ වෙමි. ඕනෑම ප්‍රකාශනයකදී තීරකවරුන් අතින් සිදුවන්නේ මහඟු උදව්වකි. මෙහිදීත් අත්පිටපත කිහිපවරක් කියවමින් අඩුපාඩු ගැන සැලකිලිමත් වූ නිර්ණාමික තීරකවරුන්ට මගේ ස්තූතිය පිරිනැමෙයි. අධ්‍යාපනයේ වටිනාකම කියා දෙමින් කුඩා කළ සිටම පත පොතට ඇලුම්කිරීමට මා පුරුදු පුහුණු කළ මගේ දයාබර දෙමව්පියන්ටත්, සැමදා සහයෝගය ලබා දෙමින් මා දිරිමත් කරන අතුලටත්, මාලින් සහ වත්සලාටත් මගේ කෘතඥතාවය හිමිවේ.

සුධීරා වැදිසිංහ රන්වල